**උකුවෙල ප්‍රාදේශීය සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**
**-----------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

**2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

**මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුස්තකාල පොත් පරිත්‍යාග රු.99,404 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ රු.975,333 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | සභා කාර්යාලය ඉහල මාලය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ණයහිමියන් රු.567,660 ක් වැඩියෙන් හා පොදු වෙළඳපල සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළ ණය හිමියන් රු.379,665 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉටු නොකළ රු.303,667 ක් වූ සංවර්ධන යෝජනා 8 ක වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඉ) | මැතිවරණ වියදම් ණයහිමියෝ රු.127,548 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඊ) | ස්ථාවර තැන්පත් 4 ක වර්ෂයට අදාළ පොළිය රු.727,692 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (උ) | 2017 වර්ෂයේ නිරවුල් වූ රු.26,274 ක සේවක ණය ශේෂයක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.144,486,232 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.10,080,555 ක නොසැසඳීම් පැවතුණි. | ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ලැබිය යුතු ගිණුම්** | | |
| | වර්ෂ 01 ත් 5 ත් අතර කාලයක් පැවති ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව රු.336,596 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | **ගෙවිය යුතු ගිණුම්** | | |
| | වර්ෂ 05 ට වැඩි කාලයක් ඉක්මවූ ගෙවියයුතු ශේෂයන්ගේ එකතුව රු.2,944,846 ක් විය. | ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පොදු ජල කනු/ නල ළිං තැන්පත් රු.220,916 ක් හා පොදු තැන්පත් රු.772,949 ක් ආදායමට ගැනීමට කටයුතු කරමි. |

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.51,887,109 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | උප ලේඛන නිවැරදිව පිළියෙල කළ යුතු වේ. | උප ලේඛන සකස් කර ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය 10 ඡේදය | සභාව සතු කඩ කාමර 14 ක් බදු ගත් පුද්ගලයන් අතුරු බදු දී තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | අතුරු බදුදීම් හා බදු අයිතිය විකුණා ඇති අවස්ථා පරීක්ෂා කර නිවැරදි කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.25,910,046 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,726,210 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 804,366 | 802,921 | 657,685 | 703,459 | 812,344 | 801,677 | 887,287 | 529,138 |
| බලපත්‍ර ගාස්තු | 750,000 | 750,000 | 705,800 | - | 750,000 | 750,000 | 771,845 | - |
| බදු කුලී | 3,832,000 | 3,315,965 | 2,391,380 | 48,967 | 3,102,735 | 3,066,876 | 2,024,139 | 53,555 |
| වෙනත් ආදායම් | 36,512,000 | 39,822,786 | 41,555,838 | 35,611,475 | 35,409,000 | 40,537,212 | 25,240,988 | 25,583,799 |
| එකතුව | 41,898,366 | 44,691,672 | 45,310,703 | 36,363,901 | 40,074,079 | 45,155,765 | 28,924,259 | 26,166,492 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන රජයේ දේපල 21 කට අදාළව හිඟ වරිපනම් බදු රු.95,366 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | වරිපනම් බදු ගෙවීමට රාජ්‍ය ආයතන වෙත ලිඛිතව දන්වා ඇත. |
| (ආ) | 2014 හා 2015 වර්ෂවලදී රු.1,153,397 ක් වියදම් දරා වරිපනම් ඒකක 6258 ක් සඳහා සිදුකළ වරිපනම් තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබුණි. | ගාස්තු අයකිරීමේදී නව තක්සේරු වාර්තා පදනම්කර ගත යුතු වේ. | 2020 වර්ෂයේ සිට නව තක්සේරුවට අනුව වරිපනම් බදු අයකිරීමට කටයුතු කරමි. |

2.2.3 කඩ කුලී
----------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | -------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි කඩකුලී රු.48,967 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව වසර 5 කට වරක් කඩ කාමර 45 ක කඩ කුළිය සංශෝධනය කර නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කළ යුතු වේ. | තක්සේරු වාර්තා ලබාගෙන නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරමි. |

2.2.4 ජල ගාස්තු
------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | -------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,780,189 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජංගම සේවා පැවැත්වීම හා විසන්ධි කිරීම තුළින් හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ජල ආදායම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක පරිගණක මෘදුකාංගයෙන් හිඟ ආදායම් අයකර ගැනීම් පිළිබඳ විස්තර ලබා ගැනීමට නොහැකි විය. | පරිගණක මෘදුකාංගය නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නව පරිගණක මෘදුකාංගයක් ලබාදීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව කටයුතු කරන බව දන්වා ඇතත්, මේ දක්වා ලැබී නොමැත. |

2.2.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.3,291,639 ක් සහ මුද්දර ගාස්තු රු.25,139,647 ක් විය.** | **ලැබිය යුතු ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ.** | **හිඟ මුදල් ඉදිරියේදී ගෙන්වා ගැනීමට කටයුතු කරමි.** |

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

**ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.**

**(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **සමාලෝචිත වර්ෂයේ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවැති ඇස්තමේන්තුගත වටිනාකම රු.2,334,100 ක් වූ කර්මාන්ත 15 ක් ගිවිසුම්ගත වී ඇතත්, ක්‍රියාත්මක කර නොතිබුණි.** | **නිසි අධීක්ෂණයක් පවත්වාගත යුතු අතර, ගිවිසුම් කඩකිරීම් පිළිබඳ ක්‍රියාමාර්ග ගත යුතු වේ.** | **2020 ජූනි මාසය වන විට මෙම සංවර්ධන ව්‍යාපෘති සියල්ල නිම කිරීමට කටයුතු කරමි.** |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ ටොන් 3 ක ප්‍රමාණයකින් ටොන් 1 ක් පමණ නොදිරන කසළ, සභා භූමියේ වළ දමා පස් පිරවීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන අතර දිරන කසළ ටොන් 1 ක් පමණ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා භාවිතා කර තිබුණි. කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | කසළ බැහැර කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස්වලට අනුව ක්‍රියා කිරීමටත්, කාබනික පොහොර නිපදවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. | එකතු කරන කසළ ටොන් එකක් පමණ කාබනික පොහොර නිෂ්පාදනය කරන අතර, මාර්ග දෙපස අවිධිමත්ව දමා යන කසළ ටොන් එකක් පමණ වළ දමා පස් දමන අතර, පරිසර අධිකාරියේ උපදෙස්වලට අනුව කසළ අංගනය සකස් කර පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරමින් සිටිමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය අනුව ඉලක්ක ලඟාකර ගැනීමට අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු නිවැරදිව හඳුනාගෙන සැළසුම්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | යෝජිත වැඩසටහන් හා ක්‍රියාත්මක වැඩසටහන් සඳහා ඉලක්කගත වර්ෂය වූ 2030 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්ථන ආදායම් ප්‍රාදේශීය සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීමකින් තොරව රු.**34,937,853** ක් ස්ථාවර තැන්පතුවල අයෝජනය කර තිබුණි. | පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා යොදවාගත යුතු වේ. | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල් ඉදිරියේදී ඵලදායී ලෙස සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | පසුගිය වර්ෂ **3** ක ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා අයදුම්පත් **1352** ක් ලැබී තිබුණු අතර, ඉන් අයදුම්පත් **968**කට සංවර්ධන බලපත්‍ර නිකුත්කර තිබුණි. අවස්ථා **54** කට අනුකූලතා සහතික නිකුත් කර තිබුණද අනුමත කළ අයදුම්පත් **384** ක් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කිරීමටත් අනුමැතිය ලබා නොදුන් අයදුම්පත් සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ. | අනුමැතිය ලබානොදුන් අයදුම්පත්‍ර සම්බන්ධව පසු විපරම් කටයුතු සිදුකිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ ගණනාවක සිට නිරවුල් නොවී පවතින ලැබිය යුතු සේවක ණය පොලී රු.**560,776** ක් හා සේවක ණය වැඩිපුර ලැබීම් රු.**3,432**ක් ද පැවතුණි. | සේවක ණය පොළී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සේවක ණය අයකර ගැනීම සම්බන්ධව නිලධාරීන් හා සේවක මහතුන් දැනුවත්කර ඇත. |
| (ආ) | සේවකයින් **03** දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට අයවිය යුතු රු.**273,692** ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සේවකයින් වෙත ණය ගෙවන ලෙස ලිඛිතව දන්වා ඇත. එසේ නොගෙවුවහොත් ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

3.4 **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලබාදුන් රු.5,000,000 ක් වටිනා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය නිෂ්කාර්යව පැවැතුණි. | අවශ්‍යතා ඇති වෙනත් රජයේ ආයතනයකට ලබාදීමට කටයුතු කළ යුතු වේ. | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සේවයේ යෙදවීමට මෙම ප්‍රදේශවලට අවශ්‍යතාවයක් නොමැති බැවින් ධාවනයේ යෙදවීමට නොහැකි වී ඇත. |

3.5 **අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මහා සභා රැස්වීම් හෝ කමිටු රැස්වීම් හෝ වෙනත් උත්සව හෝ රැස්වීම් පවත්වා නොතිබියදී ආහාර සඳහා රු.36,460 ක් ගෙවා තිබුණි. | අවිධිමත්ව මුදල් වැය නොකළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. දෙපාර්තමේන්තු මට්ටමින් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. |
| (ආ) | අවිධිමත් ටෙන්ඩර් පරිපාටිය අනුව රු.373,600 ක් වැය කර ඉදිකරන ලද ජංගම වෙළඳ කුටි 2 ක් නිෂ්කාර්ය වී තිබුණි. | විධිමත් ටෙන්ඩර් ක්‍රියා පරිපාටි අනුගමනය කළ යුතු වේ. | කසළ බැහැර කරන ස්ථානයට ආසන්නයේ පදිංචි ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩරය ලබාදීමට තීරණය කිරීමේදී ගැටළුකාරී තත්ත්වයක් ඇතිවීමෙන් ටෙන්ඩරය අත්හිටුවා ඇත. නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

--------------

**සැපයීම් හා සේවා**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ග්‍රාමශක්ති ගම්මානවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් රු.30,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. | | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ 178 වන රීතියේ (2)(2)(ඊ) අනුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණි. | නීති,රීති වලට අනුව කටයුතු කිරීම හා කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සිදු කළ යුතු වේ. | 2019 සැප්තැම්බර් 15 දින ප්‍රතිපාදන ලැබීම, ප්‍රමාද වී ඇස්තමේන්තු අනුමත කිරීම හා අනුඥාත කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාදවීම හේතුවෙන් ටෙන්ඩර්කරුවන්ට ප්‍රමාණවත් කාලයක් දීමට නොහැකි විය. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකර රු.17,898,705 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 06 ක් සංවිධානාත්මකව එක් එක් කර්මාන්තය සඳහා එක් මිල ගණනක් ඉදිරිපත්කර තිබියදී, ඉදිකිරීම් පවරා තිබුණි. | නීති, රීති හා මාර්ගෝපදේශවලට අනුව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු වේ. | කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවුණු බැවින් ඉල්ලුම් කළ කොන්ත්‍රාත්කරුවන් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති බව දන්වමි. |
| (ඇ) ග්‍රාමශක්ති ගම්මානවල ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණ ද, ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව ඉටු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති 03 කට අදාළව රු.10,448,436 ක් නැවත ජනාධිපති කාර්යාලයට හරවා යැවීමට සිදුවී තිබුණි. | කාර්යක්ෂමව හා නිසි සැලකිල්ලකින් යුතුව කටයුතු කළ යුතු වේ. | කර්මාන්ත දෙකක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් නොවීම, වැසි සහිත කාලගුණික තත්ත්වයක් පැවතීම හා ඉටු කළ කර්මාන්ත සඳහා මුදල් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි විය. |